# ජේසුතුමන්ට ගී

## 319 ජේසුනි ඔබට නමෝ

ජේසුනි ඔබට නමෝ
ඔබෙ පිය දෙවි තුමට නමෝ
ඔබ සමගින් නිති කල් වැජඹෙන
සුදතුම් හට ද නමෝ

සුරපුර බොදුනින් අප හද පුරවා
සිරි සිරුරින් අප හට පණ පොවලා
ජීවන ජලයෙන් පුබුදු කළේ
ඔබමය සමිඳු අපේ

ඔබෙ නාමය සැම තැන පතුරන්නම්
ඔබෙ ප්‍රේමය සැම හට පෙන්වන්නම්
දැහැමි ලෙසින් ජීවත් වෙන්නම්
ඔබමය රජිඳු අපේ

අප මව් පිය හට ආසිරි වේවා
අප සොයුරන් මිතුරන් රැක දේවා
සැම සත හට නිති සුව වේවා
අදරැති සමිඳු අපේ